# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2241/42 - 2021 අගෝස්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### මුදල් නීති පනත

මුදල් නීති පනතේ (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වැනි අධිකාරය) 10 (ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන රෙගුලාසීන් ය.

**මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,**
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2021 අගෝස්තු මස 19 වැනි දින,

"ඇ" රෙගුලාසිය

**සංචිත අවශ්‍යතා**

මුදල් මණ්ඩලය විසින් පනවන ලද හා 2013 අප්‍රේල් මස 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2013 ජුනි මස 26 වැනි දින අංක 1816/13, 2015 දෙසැම්බර් මස 31 වැනි දින අංක 1947/39, 2018 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 2089/28, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 2091/2, 2018 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 2092/62, 2018 නොවැම්බර් මස 14 වැනි දින අංක 2097/15, 2019 පෙබරවාරි මස 22 වැනි දින අංක 2111/50, 2020 මාර්තු මස 17 වැනි දින අංක 2167/4 සහ 2020 ජුනි මස 16 වැනි දින අංක 2180/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළකරන ලද දැන්වීම් මගින් සංශෝධනය කරන ලද "ඇ" රෙගුලාසිය 2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**අංක 2(i) (ආ), රෙගුලාසියෙහි** "සියයට 2.00 කට" යන වචන හා ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "සියයට 4.00 කට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

"අ" උපලේඛනය පහත දැක්වෙන රෙගුලාසි සහිත "අ" උපලේඛනය ලෙස ප්‍රතිස්ථාපනය වේ.

1A - G 34884 — 40 (2021/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*'අ' උපලේඛනය*

***වාර්තා කිරීමේ ආකෘතිය***

දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : ..................................................................................

කාල වකවානුව : ......................................................... සිට ................................................... දක්වා

(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේදී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම්හි සාමාන්‍යය වාර්තා කළ යුතුය.

| *(i)* ඉල්ලුම් තැන්පතු | *(ii)* කාලීන හා ඉතුරුම් තැන්පතු | *(iii)* ණයවර ලිපි/ප්‍රතිග්‍රහණය මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව | *(iv)* අනෙකුත් සියලුම තැන්පතු වගකීම්[1] |
|---|---|---|---|
| | | | |

1. තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

**සංචිත අවශ්‍යතා**

අදාල සංචිත කාල පරිච්ඡේදය : ..............................................................................................................

| *අයිතමය* | *අගය ශ්‍රී ලංකා රුපියල්වලින්* |
|---|---|
| 1. ණයවර ලිපි සඳහා වන සියයට 100 ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි:<br>(අ) (i) 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ<br>(ii) 2018 සැප්තැම්බර් මස 29 දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව.<br>(ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍රලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණය මත ලියකියවිලි ලබා දීමේ කොන්දේසිය අනුව සිදුකරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතාව. | |
| 2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 4.0 ක්. | |
| 3. ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2 ට වඩා වැඩියෙන් නමුත් සියයට 3 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය. | |
| 4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යායුතු මුළු සංචිත අවශ්‍යතාවය (1 + 2 - 3) | |

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බවද අපි / මම සහතික කරමු / කරමි.

දිනය : ................................ .................................................................,

නිල මුද්‍රාව

**සටහන -**

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාතවලට අනුව සංචිත අනුපාත පවත්වාගෙන යාම සඳහා ගිණුම් ගත කළ යුතු ය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.